# මොරවක්කෝරළයේ අභිචාර ක්‍රම අතර අත්තගහ මැතිරුම නම් අභිචාර ක්‍රමයේ බෞද්ධාගමික සහ මනෝවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ විමර්ශනයක්

ඇරැපෝරුවේ ධම්මසිරි හිමි[1]

## හැඳින්වීම

පුරාතනයේ සිට ශ්‍රී ලාංකේය ජන සමාජයේ මුල් බැසගත් අභිචාර රාශියක් දැකගත හැකි ය. මෙම අභිචාර ක්‍රම සඳහා නාගරික සමාජයට වඩා ග්‍රාමීය සමාජයෙහි ඉතා ඉහළ පිළිගැනීමක් සහ වටිනාකමක් පවතී. එලෙස සමාජය තුළ මුල් බැසගත් අභිචාර ක්‍රම අතර බලි තොවිල් නම් සාම්ප්‍රදායික අභිචාර ක්‍රමයට විශේෂ ස්ථානයක් හිමිවේ. එම අභිචාර ක්‍රම ප්‍රදේශයෙන් ප්‍රදේශයට පළාතින් පළාතට බොහෝ වෙනස්කම් දැකගත හැකි ය. ආචාර්ය පරම්පරාවෙන් ආචාර්ය පරම්පරාවටද බලි තොවිල් ආශ්‍රිත අභිචාර ක්‍රමයන්ගේ පැහැදිලි වෙනසක් දැකගත හැකි වේ. ඒ අතරින් දකුණු පළාතේ මොරවක්කෝරළයට ආවේණික වූ චාරිත්‍ර වාරිත්‍ර විධීන්ගෙන් සමන්විත වූ බලි තොවිල් යාග සම්ප්‍රදාය තුළ එන ප්‍රාථමික අභිචාර ක්‍රමයක් ලෙසට අත්බලි යාගය පෙන්වා දිය හැකි ය. අත්බලි යාගයෙන් විතැන් වූ අභිචාර ක්‍රමයක් ලෙසට අත්තගහ මැතිරුම නම් වූ අභිචාර ක්‍රමය මොරවක්කෝරළය තුළ ජනගතව ඇති අතර ගොවි කුලයට මෙම අභිචාර ක්‍රමය අයත් වේ. මෙම පාරම්පරික අභිචාර ක්‍රමයෙහි ගැබ්වී ඇති මනෝවිද්‍යාත්මක වැදගත්කම සහ එම අභිචාර ක්‍රමයට බුදු දහමේ ආගමික වැදගත්කම මුසු වී ඇති ආකාරය සහ ඒ තුළින් සමාජය අභිචාර ක්‍රමයන්ට ලබා දී ඇති වටිනාකම කෙබඳුද යන්න සාකච්ඡා කිරීම මෙහි අරමුණයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ද්විතීයක මූලාශ්‍රය පරිහරණයෙන් හා ක්ෂේත්‍ර ගවේෂණ මඟින් ලබා ගන්නා දත්ත එක්රැස් කිරීම හරහා මෙම පර්යේෂණය සිදු වේ. එහි දී විශේෂයෙන් සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ හරහා ලබා ගන්නා තොරතුරු මත පදනම් වේ. එනම් මෙය ගුණාත්මක පර්යේෂණයකි.

## සාකච්ඡාව

දකුණු පළාතේ මොරවක්කෝරළයෙහි අභිචාර ක්‍රමයන් පිළිබඳ ව හසල දැනුමක් ඇති ආචාර්ය පරම්පරාවන් රාශියක් ඇත. ඒ අතරින් මොරවක පරම්පරාවේ අත්තගහ මැතිරුම නම් අභිචාර ක්‍රමය යොදාගනු ලබන්නේ බලි තොවිල් සම්ප්‍රදායේ ගොවි ගම කුලයේ ආචාර්ය පරම්පරාවයි. අත්තගහ මැතිරුම සඳහා යොදා ගනු ලබන්නේ අඹ

1. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, පිටිපන, 10206, ශ්‍රී ලංකාව.
ls2021027@bpu.ac.lk

ගසක හෝ කොහොඹ ගසක එසේත් නැතිනම් කැබැල්ල ශාකයක අතු කැබැල්ලකි. මෙම අභිචාර ක්‍රමය ආරම්භ වන්නේ සවස හයත් රාත්‍රී නමයත් යන වෙලාවන් තුළ දීය.

පළමුව මල්යහන් සකසා රාත්‍රී 9 ට පෙර සියලු කටයුතු අවසන් කරයි. අභිචාර ක්‍රමය ආරම්භ කිරීමට මත්තෙන් ආතුරයා සභාව මැදට වහන්තරාවකින් ආවරණය කොට ගෙන රැගෙන එයි. තරමක් උස ආසනයක ආතුරයා වාඩි කොට ඔහුගේ පාද හීනැටි සහලින් පොලව මත සකසන ලද අටමගල මත තබයි. ආතුරයා ලවා මල් යහන් මත පහන් දල්වා අත්තගහ මැතිරුම ආරම්භ කරයි. එසේ ආරම්භ කිරීමෙන් අනතුරුව මන්ත්‍ර කියවනු ලබන කපු මහතා විසින් යාග ඉතිහාසය පිළිබඳ ව කියවෙන කවි ශ්ලෝක ගායනා කරමින් ආශීර්වාද කරයි. ඒ අවස්ථාවේදීම දුම් ඇල්ලීම සිදු කරන අතර සිදුවෙන චාරිත්‍ර වාරිත්‍ර සඳහා රැස්ව සිටින සියලුම දෙනාගේ සහයෝගය සලසා දෙයි. බුදුගුණ සහිත මන්ත්‍ර ගායනා කරමින් තුනුරුවන් වන්දනා කරමින් සිදු කරන මූලික චාරිත්‍ර සිදුකිරීමෙන් අනතුරුව කොහොඹ ඉතිකබැල්ලෙන් මතුරන ලද කහදියර ආතුරයාගේ මුහුණට සහ ශරීරයට ඉසිනු ලබයි. එසේ කහ දියර ඉසීමෙන් දෙවැනි චාරිත්‍රය අවසන් වන අතර ඉන් අනතුරුව සිරස පාද කවි, වජ්කවි, අඹ අත්ත පිළිබඳ කවි, උණවීදිය කවි ආදී කවි රාශියක් ගායනා කරමින් ආශිර්වාද කරයි. ඉන් අනතුරුව දෙහි කැපීම ආරම්භ කරයි. කපු මහතා විසින් දෙහි ගෙඩියක් ගෙන ගිරය මත රඳවා ආතුරයාගේ නළලින් ආරම්භ කොට නළලට ගිරය තබා ඉන් අනතුරුව පිළිවෙළට බෙල්ල, දෙව්රහිස, පපුව, දෙදණ හිස, මාපට ඇඟිලි යන ස්ථානවලට දෙහි ගෙඩිය සහිත ගිරය තබා අවසානයේ නැවතත් නළල මැදට ගිරය ගෙන දෙහි ගෙඩිය කපයි. මෙම ආකාරයට ආතුරයාගේ ස්වභාවය අනුව දෙහි ගෙඩි හතක්, දෙහි ගෙඩි 21ක්, දෙහි ගෙඩි එකසිය අටක් ආදී වශයෙන් කපනු ලබයි. කැපීමෙන් අනතුරුව දෙහිගෙඩියේ කොටස් දෙක ජල බඳුනකට දමයි. මන්ත්‍ර ගායනා කරමින් දුම් අල්ලමින් කහදියර ඉසිමින් කපු මහතා විසින් ආතුරයා හට ආශිර්වාද කරයි. මේ ආකාරයට අලුයම දක්වා සිදුවන දෙහි කැපීම අවසානයේදී කපු මහතා විසින් ඒ සඳහා යොදාගත් කපන ලද දෙහි නොපෑගෙන ලෙස ගලාගෙන යන ජලය සහිත ස්ථානයකට බැහැර කරන ලෙසට නිවැසියන්ට දැනුම් දෙයි. මෙම සියලු අභිචාර විධි අවසන් වන්නේ ආතුරයාට පොරවන ලද ආතුර වහන්වතරාව ආතුරයා විසින්ම මල් බුලත් තට්ටුවට විසි කිරීමෙනි.

ඉහත සඳහන් කළ අත්තගහ මැතිරුමනම් අභිචාර ක්‍රමයේ ඇති බෞද්ධාගමික පසුබිම පරීක්ෂා කිරීමේ දී පැහැදිලිව ම ආරම්භයේ සිට අවසානය දක්වා ම බෞද්ධාග මික චාරිත්‍ර සහ වාරිත්‍ර පමණක් නොව පිරිත් සූත්‍ර පාඨ තුනුරුවන්ගේ ගුණ කියවෙන පාඨයන් යොදාගැනීම පැහැදිලි ව දැකබලා ගත හැකි ය. එයට උදාහරණයක් ලෙස අත්තගහ මැතිරුම අභිචාර ක්‍රමය තුළ එන පහත සිරස පාද කවිය පෙන්වා දිය හැකි ය.

විශේෂයෙන් අපෙ බෝසත් වැඩ හිද සිරිමා බෝ මුල
තොසේ වඩන පාරමිතා දස බිම්බර ගෙන වෙද කල
එසේ මුනිදු මතු බුදුවි පන්සිල් රැක අනුහස් බල
හිසේ නළල දෝෂය හැර එ අනුහසින් සුභ මංගල

මේ ආකාරයෙන් බෝසත් උපතේ සිට බුදු සිරිතේ එන බොහෝ සිදුවීම් කවි ශ්ලෝක මගින් ගායනා කරමින් ආතුරයාගේ සිතෙහි සුවවීම පිළිබඳ ව විශ්වාසයක්

ඇති කරවයි. එමෙන් ම ආතුරයා විසින් ම පහන් දැල්වීම සිදු කරවීම තුළින් තමන් වෙනුවෙන්ම තමන්ගේ සමීපතමයන් සිදුකරන කැපවීම සහ සමීපතමයන් තුළ ආතුරයා පිළිබඳ ව ඇති ඇල්ම ආතුරයාහට අවබෝධ කරවයි. එයද මනෝවිද්‍යාත්මක සිදුවීමකි. එමෙන් ම බුදු සිරිත පුරාවටම ඇත්තේ කොතරම් කායික මානසික බාධක පැමිණියත් ඒවා ජයග්‍රහණය කරන ආකාරය සහ ජයගැනීමට නොහැකි අභියෝගයක් නොමැති බව යි. එයින් රෝගියාගේ මනස දැඩි ලෙස ශක්තිමත් කරයි.

අත්තගහ මැතිරුම නම් අභිචාර ක්‍රමයේ ඇති මනෝවිද්‍යාත්මක පසුබිම අධ්‍යයනය කිරීමේ දී විශේෂයෙන් ම මෙම අභිචාර ක්‍රමය යොදාගන්නා කාලය, යොදාග නු ලබන භාණ්ඩ අතීතයේ සිට ම සමාජයේ මිනිසුන්ගේ අවශ්‍යතාවන් සාධනය කිරීමටත් දේවත්වයෙන් පූජනීයත්වයට පත්වීමටත් හේතු වී ඇති ද්‍රව්‍යයන් වේ. මෙම අභිචාර ක්‍රමයේ ප්‍රධානම අංගය වන අඹ අත්තෙන් කහ දියර ඉසීම තුළින් ආතුරයා තුළ දැඩි විශ්වාසයක් ඇති කරනු ලබයි. අතීතයේ පටන් මානවයා පූජනීයත්වයෙන් ජලය සලකා ඇත. එමෙන් ම විෂබීජ නාශකයක් ලෙසටත් අපිරිසිදු ස්ථාන පිරිසිදු කිරීම සඳහා යොදා ගනු ලබන ද්‍රව්‍යයක් ලෙසටත් සිංහල ඖෂධ වර්ග නිෂ්පාදනය කිරීමේ දී ඔසුවක් ලෙසටත්, ආහාර පිළියෙල කිරීමේ දී රසකාරකයක් ලෙසටත් කහ යොදා ගනු ලබයි. කහ දියර ඉසීම තුළින් ආතුරයා තුළ මානසික වශයෙන් දැඩි විශ්වාසයක් සුවවීම පිළිබඳ ව ඇතිවෙයි. තව ද මෙම අභිචාර ක්‍රමයේදී දෙහි ගෙඩිය කපනු ලබන්නේද ශරීරයේ වැදගත් කේන්ද්‍රීය ස්ථාන සියල්ලෙහිම දෙහි ගෙඩිය ස්පර්ශ කිරීමෙන් අනතුරුව නළල මැද තබාය. ඕනෑම රෝගියෙකු විසින් පවසනු ලබන වේදනාවන් ඇති වෙන සියලු ස්ථාන මෙම දෙහි ගෙඩිය තබන ස්ථාන තුළින් ආවරණය කරනු ලබයි. ආතුරයා තුළත් නිශ්චිත වශයෙන් තමන්ට ඇති රෝගාබාධ හිසේ පටන් පාදය දක්වා මෙලෙස දෙහි ගෙඩිය ස්පර්ශ කොට කැපීම තුළින් ඒ ඒ ස්ථානවල ඇති රෝගාබාධ සුව වන බවට ද විශ්වාසය ඇති වේ. තව ද ග්‍රාමීය ජන සමාජය තුළ අසල්වැසියන් හෝ සතුරන් විසින් අණවින කොඩිවින සහ ඇස්වහ කටවහ දෝෂ ඇති කරවන බව දැඩිව විශ්වාස කරයි. මෙම යාග ක්‍රමයේදී අසල්වැසියන් සියලුම දෙනා එකතුවී උදවු උපකාර කරන බැවින් එම අදහස ද රෝගියාගේ සිතින් ඉවත්වී මානසික සුවය සැලසේ. අවසානයේ කපන ලද දෙහි කැබලි ගලා යන ජලයට එක් කිරීම තුළින් සියලුම රෝග ජලය ගලා යන ආකාරයට ශරීරයෙන් ඉවත් වී ඇති බව රෝගියාට වටහා දෙයි. මෙයද මානසික සුවපත් භාවය ඇති කිරීමට හේතු වෙයි.

**නිගමනය**

පෙර සඳහන් කරන ලද කරුණු අනුව පෙනී යන්නේ මොරවක්කෝරළයේ අත්තගහ මැතිරුම නම් අභිචාර ක්‍රමය පුරාවටම තුනුරුවන් පිළිබඳ ව යොදා ගන්නා බව යි. ඒ අනුව මෙම අභිචාරය තුළ බෞද්ධ මූලාශ්‍රයාගත කරුණු අන්තර්ගත වී ඇති බව පෙන්වා දිය හැකි ය. එමෙන් ම රෝගියාට සෑම අවස්ථාවකම තමන්ගේ රෝගී තත්ත්වය සුව වනවා යන විශ්වාසය ඇති වන ආකාරයට කටයුතු කිරීම තුළින් මානසික පසුබිම යහපත්ව පවත්වා ගැනීමට මනෝවිද්‍යාත්මක පසුබිමකින් කටයුතු කොට ඇත. මෙම කරුණු මත මෙම අභිචාර ක්‍රමය බෞද්ධාගමික පසුබිමකින් හා මනෝවිද්‍යාත්මක පසුබිමකින් යුක්ත බව නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** අත්තගහ මැතිරුම, අටමගල, ආතුරයා, මොරවක්කෝරළය, වහන්වතරාව

## ආශ්‍රිත ග්‍රන්ථ


කෝට්ටගොඩ ජයසේන, (1998). *මැණික්පාල ශාන්තිය හෙවත් සූනියම් කැපිල්ල*, කටුවාවල, බොරලැසේගමුවඃ ජේ.කේ පබ්ලිකේෂන්ස්.

ගුණසිංහ ආනන්ද, (2012). *ශාන්තිකර්ම රෝග ව්‍යුපශමන විධි සහ බුදුසමය*, මහරගමඃ තරංජි ප්‍රින්ටර්ස්, පීරිස් ඥානසිරි, (2009). ශාන්තිකර්ම හා අභිචාර විධි, දංකොටුවඃ වාසනා ප්‍රින්ටර්ස්.

දිසානායක, මුදියන්සේ (2014). *විත කැපුම් යාග විග්‍රහය*, කොළඹ 10ඃ සී/ ස ගොඩගේ සහ සහොදරයෝ පුද්ගලික සමාගම.